සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனதுஇல / My No: DDD/HO/03/ACC/අනි.ඉති.

ඔබේ අංකය / உமது இல / Your No: ........................................

දිනය / திகதி / Date: 2016/05/25

සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියලුම දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,
සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන්,
සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අධීක්ෂණ කළමනාකරුවන්,
සියලුම දිවිනැගුම ප්‍රජාමුල බැංකු කළමනාකරුවන්.

<u>දිවිනැගුම ප්‍රතිලාභීන් වෙනුවෙන් මාසිකව බැර කරනු ලබන අනිවාර්ය ඉතිරි කිරීම් මුදල් ආයෝජනය කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ DDD/HO/SW/15/02/01 හා 2016/05/02 දිනැති ලිපියට අමතර වශයෙනි. දිවිනැගුම සහනාධාර ලබාදීමේදී මෙතෙක් අනුගමනය කරන ලද ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් මුදල් ප්‍රතිලාභි ගිණුම් වලට ගිණුම්ගත කිරීම හා ආයෝජනය කිරීමේ ක්‍රමවේදය 2016 මැයි 01 දින සිට සංශෝධනය කරනු ලැබේ.

02. දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් විසින් ලබාදෙන පෙර මාසයට අදාල උපරිම වාර්තාව පදනම් කරගෙන අදාල මාසයට ගෙවිය යුතු අග්‍රිම මුදල් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලබයි. එම වාර්තාව පදනම් කරගනිමින් ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතුරුම් මුදල් හා මුදලින් ලබා දෙන සහනාධාර වටිනාකම් එකතුව ඍජුවම දිවිනැගුම බැංකුව වෙත බැර කිරීම සිදු නොකරන අතර, 2016 මැයි මස සිට ප්‍රතිලාභීන්ගේ මුදල් සහනාධාර වටිනාකම පමණක් දිවිනැගුම බැංකුව වෙත සම්ප්‍රේෂණය ක්‍රමය යටතේ බැර කිරීමට මුදල් අංශය කටයුතු කරනු ඇත.

03. දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතුරුම් මුදල් ප්‍රධාන කාර්යාලයේ අනිවාර්ය ඉතිරි කිරීම් ඒකකය විසින් ආයෝජනය සිදු කරනු ලබන බැවින්, ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් මුදල් ගිණුම් වලට බැර කිරීමේ ක්‍රියාවලිය පෙර පරිදිම සිදු කළ යුතුය. අනිවාර්ය ඉතිරි කිරීම් ඒකකය විසින් එක් එක් බැංකු වලට අදාල අනිවාර්ය ඉතුරුම් මුදල් මාසිකව ලිඛිත නිවේදන මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූලස්ථාන කළමනාකරු වෙත දන්වනු ලබයි. මූලස්ථාන කළමනාකරු විසින් එම නිවේදනය ලද වහාම අදාල බැංකු වෙත ලබා දිය යුතු අතර, එම නිවේදන බැංකු වෙත ලබාදුන් බවට ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. එම නිවේදන බැංකු වෙත ලැබීමෙන් පසු පොදු ලෙජරයේ පහත ගිණුම් විවෘත කර ගිණුම් සටහන් තැබිය යුතුය. (2016/05/02 ලිපිය මඟින් හඳුන්වා දුන් ගිණුම් සටහන් පහත පරිදි සංශෝධනය වේ. )

I. හර - දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආයෝජනය කරන ලද අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම 2016 මැයි සිට (කේත අංකය 3005)

   බැර - දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම් වලට බැර කළ යුතු අරමුදල් ගිණුම 2016 මැයි සිට (කේත අංකය 4050)

II. සහනාධාරලාභීන්ගේ මුදල් පෞද්ගලික ගිණුම් වලට බැර කිරීමේදී,

   හර - දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම් වලට බැර කළ යුතු අරමුදල් ගිණුම 2016 මැයි සිට (කේත අංකය 4050)

   බැර - අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පතු ගිණුම (කේත අංකය 4408)

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
Tel:011-2873802/2872202
Fax -011-2889002
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂජනරාල් / மேலதிகபணிப்பாளர்தலைமையதிபதி / Additional DirectorGeneral
011-2871672
011-2871672
adg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர்(நிர்வாகம்) / Director (Administration)
011-2873799
011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය / அலுவலகம் / Office
011-2887280
**011- 2887722**(Hotline)

04. අනිවාර්ය ඉතිරි කිරීම් බැර නිවේදන බැංකු වලට ලැබු විගස පුද්ගලික ගිණුම් වලට බැර කිරීම කඩිනමින් සිදු කිරීම බැංකු කාර්ය මණ්ඩලය විසින් සිදු කළ යුතුය. මෙහිදී සෑම විටම ප්‍රතිලාභි පුද්ගල ගිණුම් වලට බැර කිරීමෙන් පසු අනිවාර්ය ඉතිරි කිරීම් බැර කළ යුතු ගිණුමේ (කේත අංකය 4050 ) ශේෂය ශුන්‍ය වේ. මෙහිදී කිසි විටකත් අනිවාර්ය ඉතිරි කිරීම් බැර කළ යුතු ගිණුමේ හඳුනා නොගත් ප්‍රතිලාභින්ගේ මුදල් ලෙස තබා ගැනීමක් සිදු නොවීමට බැංකු කළමනාකරු විසින් වග බලාගත යුතුය. සුවිශේෂී හේතුවක් මත දිවිනැගුම ප්‍රතිලාභින්ගේ අනිවාර්ය ඉතුරුම් ගිණුම් වලට බැර කළ යුතු ගිණුමේ ප්‍රතිලාභීන්ට බැර කළ නොහැකි ශේෂයක් පැවතුනහොත්, එවැනි අවස්ථාවක 2008/08/06 දිනැති අංක ස/අධි/2/2/1-4/V 10 දරණ ලිපියේ ඇමුණුම 02 පරිදි ලේඛනය සකස් කර අදාල මාසය තුළදීම අනිවාර්ය ඉතිරි කිරීම් ආයෝජන ඒකකය වෙත එවිය යුතුය. එහිදී කිසි විටකත් ඊට අදාල මුදල් ප්‍රධාන කාර්යාලයේ අනිවාර්ය ඉතිරි කිරීම් ආයෝජන ඒකකය වෙත එවිය යුතු නොවේ. එනම් මෙම අනිවාර්ය ඉතුරුම් මුදල් මේ වන විටත් අනිවාර්ය ඉතිරි කිරීම් ආයෝජන ඒකකය විසින් ආයෝජනය කර ඇති බැවිනි.

05. සමෘද්ධි සහනාධාර දීමනා එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් තවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට මාරු කිරීමේ නිවේදන මෙහෙයුම් උපදෙස් අංක 10 ඇමුණුම 10,11,12,13 අනුව කටයුතු කළ යුතුයි.

06. සහනාධාර හිමිකම් ලබන ළමා නිවාස, වැඩිහිටි නිවාස, පූජ්‍ය පක්ෂය, ආබාධිත නිවාස වල සිටින ප්‍රතිලාභීන් සඳහා ලබා දෙන දිවිනැගුම සහනාධාරය මුදල් සහ අනිවාර්ය ඉතිරි කිරීම් මුදල් ඇතුලත් කර අග්‍රිම නිකුත් කරනු ලබන බැවින්, එම ආයතන සඳහා සහනාධාර ගෙවීම් කරනු ලබන දිවිනැගුම ප්‍රජාමූල බැංකුව අදාල ප්‍රතිලාභීන් වෙත දිවිනැගුම මුදල් සහනාධාර සහ අනිවාර්ය ඉතිරි කිරීම් මුදල්ද ඇතුළත්ව ප්‍රතිලාභීන්ට ගෙවීම් සිදුකළ යුතුය. එහෙත් 2016 මැයි මස අනිවාර්ය ඉතිරි කිරීම් මුදල 2016 ජූනි මස සහනාධාර මුදල් සමග එවනු ලබන බැවින්, ඒ පිළිබඳ අවශ්‍ය පරිදි ගැලපීම් කළ යුතුය.

07. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පැවති අවධියේදී අනිවාර්ය ඉතිරි කිරීම් ආයෝජනය කිරීම් සම්බන්ධව ලබාදී ඇති උපදෙස් හා ඊට පසුව එකතු කරන ලද එකතු කිරීම් සහිතව මෙම චක්‍ර ලේඛනයේ ඇතුළත් තොරතුරු ද ඇතුළත් කර සවිස්තරාත්මකව චක්‍ර ලේඛනයක් ඔබට ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. සමෘද්ධි අධිකාරියේ කාලසීමාව තුළ නිකුත් කළ චක්‍ර ලේඛ අනුව අනිවාර්ය ඉතිරි කිරීම් බැර කළ යුතු ගිණුම් වන කේත අංක 4002, 4039 හි ශේෂයක් පවතින්නේ නම්, ඒවා සියල්ල ගණුදෙනුකරුවන්ගේ ගිණුම් වෙත බැර කොට 2016/06/30 දිනට පෙර එම ගිණුම් ශුන්‍ය කළ යුතුය. මේ පිළිබඳව දිස්ත්‍රික් මට්ටමින් පසු විපරම් කිරීම දිස්ත්‍රික් අධීක්ෂණ කළමනාකරුවන් විසින් සිදු කළ යුතුය.

08. මේ සම්බන්ධව පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නම්, දුරකථන අංක 011-2889006 ඔස්සේ අනිවාර්ය ඉතිරි කිරීම් ආයෝජන ඒකකයේ ගණකාධිකාරී ( වත්කම් සහ සහනාධාර) - කේ.කේ.එල්. චන්ද්‍රතිලක මහතා අමතන ලෙස වැඩි දුරටත් දන්වා සිටිමු.

**දිවිනැගුම වැඩ සටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ දක්වන සහයෝගය අගය කොට සලකමු.**



**චන්ද්‍රා වික්‍රමසිංහ,**
**අධ්‍යක්ෂ ජනරාල්**

පිටපත්:-

01. ලේකම්, සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
02. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක - කා.දැ.ගැ.ස.
04. ප්‍රධාන ගණකාධිකාරී - කා.දැ.ගැ.ස.
05. අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) - කා.දැ.ගැ.ස.